ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2023-05-19

පැමිණිලි පාර්ශවය : 01. යූ.එල්. ධර්මලතා මිය,
ලේඛනාධිකාරී,
උසස් තාක්ෂණ ආයතනය,
ගම්පහ.

02. පී.පී.ඩබ්.එල්. ඒකනායක මයා,
නො 18, ඒ කැත්තතුඩාව, හොරණ.

03. ඩී.ඒ. සමරකෝන් මයා,
461/4/එච්, 3 වන පටුමග,
එන්.ටී.පෙරේරා මාවත, අංගොඩ.

වගඋත්තර පාර්ශවය : 01. ලේකම්,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
වෝඩ් පෙදෙස, කොළඹ 07.

02. අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂ අධ්‍යාපන ආයතනය,
අංක 320, ජනවතු පියස, ටී.බී.ජයා මාවත, කොළඹ 10.

04. අධ්‍යක්ෂ ජනරාල්,
වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති- දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය, කොළඹ 01.

05. අධ්‍යක්ෂ ජනරාල්,
කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

<u>පැමිණිලි අංක : HRC/3530/15, HRC/3531/15, HRC/3532/15</u>



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිල්ලේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකරුවන් විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇති පැමිණිලි තුළින් සඳහන් කර ඇත්තේ, එක සමාන සුදුසුකම් යටතේ හා එකම බඳවා ගැනීමේ පටිපාටියක් යටතේ එකම වැටුප් බාණ්ඩයකට බඳවා ගනු ලැබූ නිලධාරීන් වන සුභසාධක ස්ථාපන නිලධාරීන් ද ගණකාධිකාරීන් සහ සහකාර කථිකාචාර්යවරුන් ද කටයුතු කළ අතර සුභසාධන හා ස්ථාපන නිලධාරීන්ගේ පමණක් සහනදායී බදු පදනම යටතේ මෝටර් රථ ආනයනයට ලබාදී තිබූ බලපත්‍ර අවලංගු කිරීමෙන් පැමිණිලිකරුවන්ට එක ආකාරයකටත් ඉහත කී අනිකුත් නිලධාරීන්ට තවත් ආකාරයකටත් ලෙස නීතිය ඉදිරියේ ඇති සමානාත්මතාවයේ අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කරන ලද බවයි. මේ අනුව 2015.05.27 දින සිට නිකුත් කරන ලද මෝටර් රථ ආනයන බලපත්‍රය අවලංගු කිරීම වලංගු කර දෙන ලෙස ද කරන ලද මූලික අයිතිවාසිකම් කඩ කිරීම සම්බන්ධව පරීක්ෂණ කටයුතු සිදු කර සාධාරණ වන්දි මුදලක් ලබාදෙන ලෙසද පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

පැමිණිල්ලේ කරුණු තහවුරු කරනු වස්, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2012.11.26 දිනැති අංක ඩීඑම්එස්/ජීඅයි/54/7/342/1 දරණ ලිපිය ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ, නව බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීමෙන් පසු සහකාර ලේඛකාධිකාරී තනතුරු සඳහා පැන නැගී ඇති ගැටළුවට විසඳුම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් විමසීම් කර ඇති බවය. ඒ අනුව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට සහකාර ලේඛකාධිකාරී තනතුරු වල අවශ්‍යතාවය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන ලෙස එම ආයතනය සමග කරන ලද සාකච්ඡාවකදී ආයතනයට දන්වන ලද පරිදි වාර්තාවක් ඉදිරිපත් කර ඇති බව ද එම වාර්තාවේ අන්තර්ගත කරුණු සම්බන්ධව ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව ඊට පිළිතුරු ලබාදී ඇති බව දක්වා ඇත.

කළමණාකරණ සේවා චක්‍රලේඛ 30/2006 අනුව වැටුප් සකස් කිරීමේදී පදනම් කරගත් ක්‍රමවේදය අනුව පැමිණිලිකරුවන්ගේ තනතුරු සඳහා ලබාදී ඇති වැටුප් කේත හා පරිමාණය පිළිබඳව එකී ලිපියේ දක්වා ඇති අතර, වැඩිදුරටත් දක්වා ඇත්තේ, සහකාර ලේඛකාධිකාරී තනතුර කළමණාකරණ සේවා චක්‍රලේඛය අනුව අඩු වැටුප් ක්‍රමයක පිහිටුවා තිබෙන බවත්, එය 30/2006 චක්‍රලේඛය අනුව එම්එම්1-1 වැටුප් කේතයේ තබා ඇති බවත්ය. නමුත් පැමිණිලිකරුවන් පෙන්වා දෙන කරුණු අනුව පෙනී යන්නේ ඔවුන් සහකාර ලේඛකාධිකාරී තනතුරට සමාන තත්ත්වයේ සිටියද JM බාණ්ඩයට අනුගත කර ඇති බවයි. එමෙන්ම ලේඛකාධිකාරීන් ලෙස කටයුතු කරනු ලබන පැමිණිලිකරුවන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් ලේඛකාධිකාරී තනතුරට අන්තර්ග්‍රහණය කළද ඔවුන් පෙර දැරූ තනතුර වන සුභසාධක ස්ථාපන නිලධාරී තනතුර මෙම වාහන බලපත්‍ර ලබාගැනීම සඳහා අදාළ තනතුරක් නොවන බව වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම වේ. එබැවින් සුභසාධක නිලධාරී තනතුරේ සේවය කළ කාලය සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීමට අදාළ කරගත නොහැකි බව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2015.08.07 දින තම අංක ඩීඑම්එස්/1563/වීඑල්-1 මගින් වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත දක්වා ඇත. ඒ අනුව වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් තම අංක ටීඅයිපී/01/පර්මිට්(xvii) යටතේ 2015.08.26 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත

'ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ලේඛකාධිකාරී තනතුරු දරණ නිලධාරීන්ගේ සහකාර ලේඛකාධිකාරී තනතුරු දැරූ කාලයත් සුහසාධක ස්ථාපන නිලධාරී තනතුරු දැරූ කාලයත් මෙම බලපත්‍ර නිකුත් කිරීම සඳහා අදාළ කරගත නොහැකි බව' දන්වා ඇත. නමුත් පැමිණිලිකරුවන් දක්වා ඇත්තේ, එක සමාන සුදුසුකම් යටතේ එකම බඳවා ගැනීම් පටිපාටියක් යටතේ එකම වැටුප් බාණ්ඩයකට බඳවා ගනු ලැබූ නිලධාරීන් වන සුහසාධක ස්ථාපන නිලධාරීන් ද ගණකාධිකාරීන් ද සහකාර කථිකාචාර්ය තනතුරු ද අදාළ වන බැවින් සුහසාධක හා ස්ථාපන නිලධාරීන්ගේ පමණක් බලපත්‍ර අවලංගු කිරීම තුළින් මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුව ඇති බවයි.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2013 යටතේ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ MMARHM බාණ්ඩයේ නිලධාරීන්ට සහනදායී මෝටර් රථ බලපත්‍ර ලබාගැනීමට හිමිකම ඇති බව පිළිගෙන ඇත. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂකගේ නිර්දේශය මත අංක Admin/5/V.P.(ii) හා 2015.04.08 දිනැති ලිපිය මගින් පැමිණිලිකරුවන් තිදෙනා සඳහා සහනදායී මෝටර් රථ අයදුම්පත් අමාත්‍යාංශය වෙත එවා තිබුණු බව පිළිගෙන ඇත. එම තිදෙනාම ලේඛකාධිකාරීන් බව ද, එම අයදුම්පත අනුව වසර 12ක සක්‍රීය සේවා කාලයක් පැවතීමද වැටුප් රහිත නිවාඩු ලබා නොගැනීම ද එම්එම්1-1-2006 වැටුප් බාණ්ඩයට අයත් වීම හා පාලක සභා අනුමැතිය අනුව 2008.07.01 දින සිට ලේඛකාධිකාරී ලෙස පත්කර තිබීම ද සහකාර කථිකාචාර්ය වැටුපට සමාන බව ද දක්වා ඇත.

එමෙන්ම මෙම බලපත්‍ර තුන, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත මෙම නිලධාරීන්ට එරෙහිව ලද දුරකථන පෙත්සමක් අනුව ඔවුන්ගේ මුල් පත්වීම වන සුහසාධක ස්ථාපන නිලධාරී තනතුර සහනදායී මෝටර් රථ බලපත්‍රය ලබාගැනීමට අදාළ කර ගතහැකිද යන්න පිළිබඳ ගැටළුවක් පැන නැගුණ බව දක්වා ඇත. පසුව මේ පිළිබඳ වෙළෙඳ තීරුබදු ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසා ඇති අතර, ඒ අනුව දක්වා ඇත්තේ, කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේදී සුහසාධක ස්ථාපන නිලධාරී තනතුර පහළ කළමණාකරණ (JM) බාණ්ඩයේ තනතුරක් වන බැවින් බලපත්‍ර නිකුත් කිරීමේදී එය අදාළ කරගත නොහැකි බවය. 2014.05.23 දින සිට බලපැවැත්වෙන පරිදි ලේඛකාධිකාරී තනතුර ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අනුමත කර ඇති බව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් පිළිගෙන ඇත. ඒ අනුව පැමිණිලිකරුවන්ගේ බලපත්‍ර තුන 2015.09.03 දින සිට අවලංගු කරන ලද බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත.

**පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

2015.05.27 දින ඔවුන්ට සහනදායී වාහන බලපත්‍ර නිකුත් කළ බවත්, ඒ අනුව වාහන ආනයනය කළ බවත්, 2015.09.03 දින බලපත්‍ර අවලංගු කිරීම මත ඔවුන් බලවත් අසීරුතාවයකට පත්ව සිටින බවත් පැමිණිල්ලෙන් පෙන්වා දී ඇත. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සුහසාධක/ස්ථාපන නිලධාරී තනතුරු වලට පැමිණිලිකරුවන් 1999 වසරේදී බැඳුණු බවත්, 2008 වසර දක්වා සේවා වර්ගීකරණයකට ලක් නොවූ

අතර, මාණ්ඩලික ගණයේ තනතුරු ලෙස එහි කටයුතු කළ බවත් 30/2006 දරණ කළමණාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ තනතුරු ප්‍රතිව්‍යුහගත කිරීමේදී මෙම තනතුර කණිෂ්ඨ කළමණාකරණ (JM) බාණ්ඩයේ තනතුරකට අදාළව සහකාර ලේඛකාධිකාරී තනතුර යටතේ ඔවුන් පිහිටවූ පසු මෙම ගැටළුව ඇති වූ බැවින් දිගින් දිගටම වගඋත්තරකරුවන්ට කරුණු කියා පෑමෙන් පසු 2014.05.23 දින සිට මධ්‍යම මට්ටමේ කළමණාකරණ බාණ්ඩයට (MM) ලෙස පත්වූ බවත්, එය 2008.07.01 දින සිට බලපැවැත්වෙන පරිදි පිහිටුවා ඇති බවත්, පෙන්වා දී ඇත.

විධායක ශ්‍රේණියේ නිලධාරින් ලෙස පැමිණිලිකරුවන් වාහන බලපත්‍රයට සුදුසුකම් ලාභීන් බව පෙන්වා දුන්නද වගඋත්තකරකරුවන් දක්වා සිටින්නේ, පැමිණිලිකරුවන් විසින් මුලින් ලබාදෙන ලද තොරතුරු අනුව බලපත්‍ර නිකුත් කළ ද පසුව 2008 වසරේ සිට පැමිණිලිකරුවන් විධායක නොවන ශ්‍රේණියේ තනතුරු වල 2014 වසර වනතුරු සේවය කිරිම මත බලපත්‍ර අහෝසි කළ බවය. පැමිණිලිකරුවන් වැඩිදුරටත් දක්වා ඇත්තේ, ඔවුන්ගේ පෙර කී සේවා කාලය ගණනය කළද ඔවුන්ට සමාන සේවා තත්ත්වයක ලා සළකන ලද වෙනත් නිලධාරීන්ට බලපත්‍ර ලබාදී තිබියදී ඔවුන්ගේ 2008 වසරට පෙර තිබූ සේවා කාලය පවා මේ සඳහා සළකා බලා තිබී ඇතත්, පැමිණිලිකරුවන්ගේ එකී කාලය නොසළකා හැරීම ගැටළු සහගත බව ය. පැමිණිලිකරුවන් සමග එකට සේවයට බැඳුණු ගණකාධිකාරී තනතුරු වලට ද සහකාර කථිකාචාර්ය තනතුරු වලටද එම බලපත්‍ර ලබාදීමේදී 2008 වසරට පෙර කාලය සළකා බලා ඇතත්, පැමිණිලිකරුවන්ගේ එකී කාලය නොසළකා හැරීම පිළිබඳව වගඋත්තරකරුවන් පෙන්වා දෙන තවත් කාරණාවක් වන්නේ ගණකාධිකාරින් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ නඩුවක් සම්බන්ධව තොරතුරු පවතින බවය. එහෙත් පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තරකරුවන් විසින් ඔවුන් සන්තකයේ එකී තොරතුරු නොතිබීම මත වැඩිදුර කරුණු දක්වා නොසිටින ලදි. ඒ අනුව පැමිණිලිකරුවන්ගේ බලපත්‍ර අවලංගු කළ ද ඔවුන් හා සමාන තත්ත්වයකින් සමාන වැටුප් බාණ්ඩ වල සිටි සහකාර කථිකාචාර්ය වරුන්ගේද ගණකාධිකාරිවරුන්ගේ ද බලපත්‍ර අවලංගු කිරීමක් සිදු නොකර පැමිණිලිකරුවන්ගේ පමණක් බලපත්‍ර අවලංගු කිරීම පිළිබඳ සාධාරණ හේතුවක් පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තරකරුවන් වෙතින් ඉදිරිපත් වී නොමැත.

**නිරීක්ෂණ හා නිගමන :-**

පැමිණිලිකරුවන් තිදෙනා කළමණාකරණ මට්ටමේ තනතුරක් වන සුභසාධන හා ස්ථාපන නිලධාරී තනතුර සඳහා 1999 සහ 2000 වසර වලදී බඳවා ගෙන තිබෙන බවද එම වර්ෂවලදීම ඊට සමාන තනතුරු බවට පෙන්වා දෙනු ලබන ගණකාධිකාරී සහ සහකාර කථිකාචාර්ය තනතුරු සඳහාද නිලධාරීන් බඳවාගෙන ඇති අතර, මෙකී තනතුරු වර්ග තුනෙහිම වැටුප් සමාන බාණ්ඩයක පිහිටුවා තිබී ඇති බව නිරීක්ෂණය වේ. 2008 වර්ෂයෙන් පසුව මෙම තනතුරු වලට අදාළ වැටුප් බාණ්ඩ නම් කිරීමේදී ගණකාධිකාරී සහ සහකාර කථිකාචාර්ය තනතුරු වලට MM බාණ්ඩය හෝ AR බාණ්ඩයට අන්තර්ග්‍රහණය කිරීම කළද පැමිණිලිකරුවන් තිදෙනාගේ තනතුරු නාමය හා වැටුප් බාණ්ඩය නිවැරදි කර ඇත්තේ, 2014 වසරේදී බව නිරීක්ෂණය වේ. එය ලේඛකාධිකාරී ලෙස MM බාණ්ඩයට අයත් තනතුරක් බව පත් කර ඇත්තේ 2014.05.23 දිනදී බව පෙනී යයි. එයද පැමිණිලිකරුවන් විසින් කළ විවිධ ඉල්ලීම් අනතුරුව සිදුවූ එකක් බව පෙනී යයි.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට එහි ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින් 2015.06.30 දින වෙළෙඳ හා ආයෝජන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දක්වා ඇත්තේ, 1999.10.01 දින පැවති බඳවා ගැනීමේ පටිපාටියට අනුව සහකාර කථිකාචාර්ය තනතුර, සුහසාධක/ස්ථාපන නිලධාරී තනතුර, ගණකාධිකාරී තනතුර වැටුප් තල එක හා සමාන තනතුරු බවත් තවද සුහසාධක/ස්ථාපන නිලධාරී තනතුර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් බවත්ය. එමෙන්ම සුහසාධක/ස්ථාපන නිලධාරී තනතුර සඳහා බඳවාගත් නිලධාරීන් 2008.07.01 දින සිට නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව එම තනතුර අහෝසි කර එදින සිට MM වැටුප් බාණ්ඩයේ ලේඛකාධිකාරී තනතුරට අන්තර් ග්‍රහණය කළ බවද දක්වා ඇත. ඒ අනුව නිරීක්ෂණය වන්නේ වගඋත්තරකරුවන් විසින් දක්වා ඇති පරිදි දුරකථනයෙන් කළ පෙත්සමක් අනුව පැමිණිලිකරුවන්ගේ බලපත්‍ර අහෝසි කළද පැමිණිලිකරුවන්ට සමාන තත්ත්වයේ සිටි කථිකාචාර්යවරුන්ගේ සහ ගණකාධිකාරීවරුන්ගේ තනතුරුවලට අදාළ බලපත්‍ර අහෝසි නොකර ඔවුන්ගේ පෙර සේවා කාලය ඊට අදාළව ගණනය කර ඇතත්, පැමිණිලිකරුවන්ගේ එකී කාලය ඊට අදාළව ගණනය කර නොමැති බවයි.

1999 වසරේ සිට ගණකාධිකාරී වරුන්ගේද සහකාර කථිකාචාර්ය වරුන්ගේ ද සුහසාධන හා ස්ථානපන නිලධාරී තනතුරද සමාන මට්ටමේ තනතුරු ලෙස එකම වැටුප් තලයක පිහිටා කටයුතු කර තිබීම ද 2008 වසරේ සිට MM බාණ්ඩයේ විධායක ශ්‍රේණියේ තනතුරු ලෙස ඒවා නම් කරමින් සුහසාධන හා ස්ථාපන නිලධාරීන්ගේ තනතුරු නාමය ලේඛකාධිකාරීන් ලෙස හඳුන්වාදී තිබුණද වාහන බලපත්‍ර ලබාදීමේදී ලේඛකාධිකාරී පැමිණිලිකරුවන්ගේ බලපත්‍ර සඳහා 1999 වසරේ සිට ඇති කාලය ගණනය කිරීම නොසලකා හැර ගණකාධිකාරීවරුන්ගේ හා සහකාර කථිකාචාර්යවරුන්ගේ පමණක් එකී කාලය වාහන බලපත්‍ර ලබාගැනීමට ගණනය කරමින් නීතිය ඉදිරියේ ඇති සමානාත්මතාවයේ අයිතිවාසිකම පැමිණිලිකරුවන් සම්බන්ධව සලකා බැලීමේදී උල්ලංඝනය වීමකට ලක්ව ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපයන් හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව ද එනම්, නීතිය ඉදිරියේ ඇති සමානාත්මතාවය හා සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම ද යුක්තිය පසිඳලීමේ ආකාරය තුළින් එහි යුක්ති සහගතභාවය හා සාධාරණත්වය නොසලකා හැර කටයුතු කරමින් වගඋත්තරකරුවන් ක්‍රියා කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපයන් හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්,

1. පැමිණිලිකරුවන් තිදෙනාට ලබාදෙන ලද වාහන බලපත්‍ර වලංගු බවට කරුණු සහිතව නැවත ලිඛිතව දැන්වියයුතු බව ද,

2. වාහන බලපත්‍ර වලංගුව පැවති කාලය තුළ ආනයනය කළ වාහන සඳහා තීරු බදු අය නොකළයුතු බව ද,

3. පැමිණිලිකරුවන් හට එකී වාහන ආනයනය කිරීම මත අය කරගන්නා ලද යම් මුදලක් හෝ වෙනත් අය කිරීමක් සිදු කර තිබේනම් එය නැවත පැමිණිලිකරුවන් වෙත ලබාදියයුතු බව ද, මින් නිර්දේශ කරනු ලැබේ.

2023. 06 . 28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7)වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධ පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. අමාත්‍යතුමා,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
වෝඩ් පෙදෙස,
කොළඹ 07.

02. අමාත්‍යතුමා,
මුදල් අමාත්‍යංශය,
කොළඹ.

B/